- <u>ලිඛිත භාෂාවෙන් ලියවුණු ලේඛන කියවීම</u>

1) චිත්‍ර ඇඳීම හැරෙන්නට දැන් මාලිට තවත් රාජකාරියක් ඇත. ඒ උදෙන් ම අවදි වී ගස් අතරින් පැනගෙන ලේනා එනතුරු බලා හිඳ ඌට කිරි පෙඟවූ පාන් කැවීමයි. ඉඳහිට දවසක මාලි ට දවල් වනතුරු නින්ද යයි. එහෙත් ලේනාගේ හඬ යන්තමින් ඇසුණු විගසින් ,තම කිරි දරුවා අවදි ව හඬන විට ඇහැරෙන මවක මෙන් ඈ වහා අවදි ව එබූ දඟරයක් අත්හල කලෙක මෙන් ඇඳෙන් පැන කුස්සියට දුවයි.
(අහස පොළව ළංවෙලා -රංජිත් ධර්මකීර්ති)

2) ටිකෙන් ටික අඳුර වැඩි වේගෙන එයි ගස් මුදුන්වල මිහිරි හඬින් ගායනා කරමින් සිටි කුරුල්ලෝ ළැගුම් පළවල් සොයා යති. කැලෑවේ එක් පැත්තක සිට අනික් පැත්තට දුවන්නට එළියට පැමිණි හාවෙක් කන් දෙක උඩ හිඳුවා ගෙන වහා ගමන් ගත් කුමාරයන් දෙදෙනා දෙස බලා සිටියි. කුමාරයන් දෙන්නා බලන්නටත් පෙර හාවා ආපසු කැලයට පැන දුවයි. (දඬු මොණරය -මාර්ටින් රුවන්

3) කටින් අල්ලා ගෙන සිටි පාන් කැබැල්ලේ වූ කිරි රස ලේනාගේ දිවට දැනී ඇත. ඌ වරෙක පාන් කැබැල්ල දෙස බලමින් , එහි රසය විඳ ගනී.කෑදර ලෙස එකවර ගිල දමනවා වෙනුවට ඌ මඳ වේලාවක් නාද කරමින් සතුට පළ කරයි. නැවැතීමකින් තොර ව සොලවන උගේ උඳුපියල්ලක් තරම් වූ මුව පොඩිය ළං කරමින් පාන් කැබෙල්ල ටිකෙන් ටික කටින් කඩා ගෙන කයි.(අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ)

4) පෙරහැර ගමන් කරන දින ද වේලාව ද දක්වා අතින් ලියන ලද දැන්වීම් කොළ මහ පාර දෙපැත්තේ පොල් ගස්වල කල් ඇති ව අලවා තැබීමෙන් ද ,අණ බෙරයෙන් ද, දැනවෙන බැවින් ගම්බද ධනවත් පවුල්වල දැරියෝ ද දිළිඳු පවුල්වල දැරියෝ ද අලුත් රෙදි ගෙන්වා ගෙන එයින් ඇඳුම් මසා ගනිති. මසුරන්ගේ දැරියෝ පරණ රෙදි හැට්ට සෝදවා මද්දා ගනිති.ස්වර්ණාභරණ නැති දිළිඳු පවුල්වල දැරියෝ තම මව් පියන් ලවා හෝ සහෝදරින් ලවා හෝ ඈත ගමක නෑයන්ගේන් කුරු ,කරාබු,ඇටවැල් ආදිය ගෙන්වා ගෙන පෙරහැර බලන්න යන දවසෙහි තම රූ සපුව ද ඇඳුම් ද පැළඳුම් ද දැක්වීමට කල් ඇතිව සූදානම් වෙති.(අපේ ගම- මාර්ටින් වික්‍රමසිංහ)

5) අනතුරුව ලෙන් පැටියා ආපසු කූඩුවේ තැන්පත් කළ ඔහු මෝටර් රථය පණ ගන්වා හෙවණක් ඇති ගසක් සොයා පදවා ගෙන ගොස් ඒ යට නැවැත්වීය. එහෙත් රත්වූ තහඩුව නිවෙන්නට තව බොහෝ වේලාවක් ගත වනු ඇත. පැටවු කීස් ගාමින් නද දෙති. (අහස පොළව ළං වෙලා-රංජිත් ධර්ම කීර්ති)

6) රුවන් ද අළු ගොඩක් මඳ වේලාවක් අල්ල තබා ගෙන සිටියේය .හරි නේද? මගේ සොයා ගැනීම අජිත් රුවන්ගේ පිටට වැරෙන් පහරක් තට්ටු කළේ ය. අන්න අන්න කටහඬක් ඇසුණා වගේ. අජිත් විස්මය පළ කොට මිදුලට ක් දුන්නේය .රුවන් ද පිටතට කන් යොමු කළේ කල්පනාවෙනි .ඔව් ,ඔව් කවුද මිනිස්සු වගයක් කතා කරන හඬ තමයි රුවන් උත්තර දුන්නේය.(තුන් යහළු වික්‍රමය - කුලසේන ෆොන්සේකා)

7) නිමල් පාන් පෙත්තක් දෙන්නට සුනිල් බොහෝ පෙරැත්ත කළේ ය.අන්තිමේ දී නිමල් එය පිළිගත්තේ ය. නමුත් ඉන්පසු කීප දවසක් ම දවල් කෑම වේලාවේ නිමල් වැසිකිළියට ගොස් සැඟවී සිට සෙල්ලම් පිට්ටනිය දිගේ පාරට විත් ආපසු පන්ති කාමරයට ආවේ ය.